# 10 ශුද්ධාත්ම දීමනා

1 කොරින්ති 12:4-11

ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අප වෙත ලබා දී ඇති විවිධ දීමනා හඳුනා ගනිමින්, එම දීමනා අන්‍යොන්‍ය යහපත වෙනුවෙන් යොමු කරන්නේ කෙසේ දැයි විමසා බලමු.

බාල මහලු කොයි කවුරුත් ත්‍යාග හෙවත් දීමනා ලැබීමට කැමැත්තෝ ය. උපන් දින, විවාහ මංගල්‍ය ආදි උත්සවවල දී ත්‍යාග හුවමාරු කර ගැනීම සිරිතක් ව පවතී.

මනුෂ්‍යයා දෙවියන් වහන්සේ වෙතින් ලබා ඇති වටිනා ම දීමනාව නැතහොත් ත්‍යාගය මිනිස් සිරුරයි. විවිධ අවයවයන්ගෙන් යුත් මිනිස් සිරුර දේව මහිමය පිළිබිඹු කෙරෙන ක්‍රියාකාරී ප්‍රාතිහාර්යයකි. එක ම ශරීරයකට සම්බන්ධ විවිධ අවයව රාශියක් ක්‍රියාත්මක වනුයේ රටාවකට මෙනි. එම අවයව රාශියක් තිබුණ ද ඒවා සියල්ල ක්‍රියාත්මක වනුයේ එක ම ශරීරයක ජීවය පවත්වා ගැනීම සඳහා ය. එලෙස ම එක ම ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් අපට විවිධ දීමනා ලැබෙන ආකාරය පහත දැක්වෙන සටහනින් විමසා බලමු.






නොමිලේ බෙදාහැරීම සඳහා ය.

මෙලෙස මනුෂ්‍යයා හා කිතුනු සභාව ආධ්‍යාත්මික ව ගොඩ නැංවීම සඳහා එක ම සමිඳාණන් වහන්සේ තුළ එක ම ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් විවිධ ආධ්‍යාත්මික දීමනා ප්‍රදානය කර ඇත.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**1 කොරින්ති 12:4-11**

මෙම විවිධ ආධ්‍යාත්මික දීමනා ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් එකිනෙකාට වෙන් වෙන් වශයෙන් ප්‍රදානය කරන සේක. මෙම දීමනා දේව සබඳතාව නිසා දේව කරුණා වෙන් අපට ලැබෙන්නක් මිස අපගේ හැකියාවන් මත ලැබෙනුයේ නොවේ.

මෙම දීමනා අපට ලැබී ඇත්තේ එකිනෙකා දිරි ගැන්වීමටත් කිතුනු සභාව ශක්තිමත් කිරීමටත් ය. සැම ශුද්ධාත්ම දීමනාවක ම එක සමාන වටිනාකමක් ඇති බවත්, සැම දෙනාට ම යම් ශුද්ධාත්ම දීමනාවක් හිමි කර දී ඇති බවත් අවබෝධ කර ගත යුතු ය.

එම දීමනා ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් තමාට ලබා දී ඇති බව පිළිගනිමින්, ඒවා අවබෝධයෙන් ග්‍රහණය කර ගැනීම කිතුනුවාගේ වගකීම වේ.

ඒ එක් එක් ශුද්ධාත්ම දීමනා පිළිබඳ ව අපි විමසා බලමු.

## ආත්මයාණන් මගින් උපදෙස් දීමේ ප්‍රඥාව

ගැටලුවක් හෝ පැහැදිලි කර ගැනීමක් යම් පුද්ගලයෙකුට මතු වූ විට එය විසඳා ගැනීමට, තෝරාගත් වෙනත් පුද්ගලයෙකුට ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟ පෙන්වීම තුළින් නිවැරැදි උපදෙස් ලබා දීමේ ප්‍රඥාව හිමි කර දීම මෙයින් අදහස් වේ.

## ශුද්ධාත්මයාණන් මගින් ධර්මය පහදා දීමේ ඥානය

අන් අය වෙත, දේව ධර්මය නිවැරැදි ව පහදා දීමට ශුද්ධාත්මයාණන් වහන්සේ වෙතින් ඥානය ලැබීම මෙයින් අදහස් වේ.

## ආත්මයාණන් තුළ විශ්වාසය

කිතුනු ජීවිතයේ නිරන්තරයෙන් පවත්වා ගත යුතු විශ්වාසයත්, එම විශ්වාසයේ උපරිමයට ඇතුළු වීමත් මින් අදහස් වේ. එම විශ්වාසය පවත්වාගෙන යෑමට නිරතුරු ව ම අපට හැකියාව ලබා දෙන්නේ ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

### ශුද්ධාත්මයාණන් තුළ සුව කිරීමේ වරම

ජේසුස් වහන්සේ අපෝස්තුලුවරුන් දෙළොස් දෙනා ධර්මදූත සේවය සඳහා පිටත් කර යවන විට මෙම ශුද්ධාත්ම දීමනාව ඔවුනට පිරිනැමූ සේක. ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් ලැබෙන මෙම පරිපූර්ණ සුවය ශාරීරික, මානසික හා ආධ්‍යාත්මික වශයෙන් තෙවැදෑරුම් වේ. මෙකී සියලු ආකාර රෝග සුව කරමින් ජනතාවට සහනය සලසා දීම සඳහා මෙම දීමනාව ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් පිරිනමනු ලැබේ.

### හාස්කම් කිරීමේ බලය

මෙය විශ්වාසය හා බලවත් යාච්ඤා තුළ අත් කර ගත හැකි ශුද්ධාත්ම දීමනාවකි. විවිධ අවස්ථාවල දී දේව බලය ප්‍රකාශ වීම ද මෙම දීමනාව තුළින් ඉටුවේ.

### දිවැස් වැකි කීමේ බලය

එනම් වර්තමානයේ සිදුවන කරුණු විමසිලිමත් ව ග්‍රහණය කර ගනිමින්, දේව එළිදරව්ව තුළින් අනාගතයේ සිදුවන දේ ගැන ප්‍රකාශ කිරීමට හැකියාව ලැබීම යි. මෙම දීමනාව දිවැසිවරුන්ට ප්‍රදානය කරන ලද මහඟු හැකියාවකි.

### ආත්ම විමසීමේ හැකියාව

වැරැදි ඉගැන්වීම් මගින් මුලා නොවන පිණිස සත්‍ය දේව ධර්මය හඳුනා ගැනීම හා හඳුන්වා දීම සඳහා මෙම දීමනාව වැදගත් වේ. මෙම ශුද්ධාත්ම දීමනාව අප නිවැරැදි දේව ධාර්මික ඉගැන්වීම් වෙත යොමු කරයි.

### අන්‍ය භාෂා කථනය

ශුද්ධාත්මයාණන් විසින් පිරිනමන විශේෂ කථන හැකියාවකි. එසේ පිරිනමනු ලබන්නේ ආධ්‍යාත්මික වශයෙන් සමූහයා සවිමත් කරනු සඳහා ය. මෙම දීමනාව ක්‍රියා 2:4-11 හි දැක්වෙන පරිදි මුල් කිතුනු සභාවේ ආරම්භක දින ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආගමනය අවස්ථාවේ ජෙරුසලමේ උඩුමහලේහි දී අත්දකින ලදි.

### අන්‍ය භාෂා පහදා දීම

වෙනත් භාෂාවකින් කථනය සිදු කළ ද එය අන්‍යයන් හට අවබෝධ කර ගත නොහැකි නම් ඉන් පලක් නොවේ. ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් ප්‍රදානය කර ඇති මෙම දීමනාව මගින් දෙවියන් වහන්සේ විසින් ලබා දෙන පණිවුඩ හා දිවැස් වැකි සමූහයාට අවබෝධ කර ගත හැකි අයුරින් ඉදිරිපත් කිරීම මෙහි දී සිදු වේ.

මෙම සියලු ශුද්ධාත්ම දීමනා පිළිබඳ දෙවිඳුන්ට තුති පිදීම කිතුනු අපගේ වගකීම වේ. මෙවැනි විවිධ වූ දීමනාවන් ශුද්ධාත්මයාණන් වහන්සේ විසින් අපට ප්‍රදානය කර ඇත්තේ දෙවියන් වහන්සේ තුළ එකිනෙකා ශක්තිමත් කිරීමටත්, ඒ තුළින් කිතුනු සභාව ගොඩනැගීමටත් ය.

එනිසා මෙම ශුද්ධාත්ම දීමනාවන් යාච්ඤාවෙන් යුතු ව අවබෝධ කර ගැනීම අවශ්‍ය වේ. තව ද මෙම ශුද්ධාත්ම දීමනා අප ලද බව තහවුරු වන්නේ සමූහයා විසින් ඒවා අපට ලැබී ඇති බව ආත්මයාණන් වහන්සේ තුළින් තහවුරු කර ගැනීමත් සමග ය.

ශුද්ධාත්ම දීමනා තුළින් අපි;

- ★ සමූහයා ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ ගොඩ නගමු
- ★ පාපයට හා නපුරට එරෙහි වෙමු
- ★ එකමුතුකමේ සෙනඟක් බිහි කරමු
- ★ දෙවිඳුන් වෙත ගෞරවය ගෙනෙමු.

**ක්‍රියාකාරකම**

1. මෙම පාඩම තුළින් ඔබ හඳුනා ගත් ශුද්ධාත්ම දීමනා පෙළ ගස්වන්න.
2. මෙම ශුද්ධාත්ම දීමනා අතුරෙන් ඔබට ඇති දීමනා හඳුනා ගෙන, එම දීමනා අන් අයගේ යහපත වෙනුවෙන් යොදවන අයුරු පැහැදිලි කරන්න.